# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/වැටුප්

ඔබේ අංකය / உமது இல / Your No: ...............

දිනය / திகதி / Date: 2025.03.26

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
ගණකාධිකාරිවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම</u>**

ඉහත කරුණට අදාළව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST-05/04/PCY/0041 හා 2025.03.25 දිනැතිව නිකුත් කරන ලද 10/2025 වැටුප් චක්‍රලේඛය හා බැඳේ. (අදාළ චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් භාගත කරගත යුතුය)

02. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන විශ්‍රාම වැටුප් සහිත සියළුම නිලධාරින්ගේ අදාළ වැටුප් පරිවර්ථනය ඉහත චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස් නිවැරදිව අවබෝධ කරගෙන වැටුප් පරිවර්ථන කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

03. මෙම කාර්යය කඩිනමින් ඉටු කළ යුතු බැවින් ඒ සඳහා දැනුම ඇති සහාය කාර්යමණ්ඩලයක් යොදවාගෙන අප්‍රේල් මස වැටුපට වැටුප් සකස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කරන මෙන් දන්වා සිටිමි.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ වැටුප් ලැබූ නිලධාරින්ගේ 2024.12.31 දිනට ලැබූ මූලික වැටුප පදනම් කරගෙන මෙම වැටුප් පරිවර්ථනය සිදු කළ යුතුය. වැටුප් පරිවර්ථන සිදු කිරීම සඳහා ලබා දී ඇති චක්‍රලේඛ ආකෘතිය මත පමණක් සිදු කළ යුතු අතර, උපලේඛන 02 හා 03 වශයෙන් මෙන්ම ආදර්ශ පරිවර්ථන ඇතුළත් ඇමුණුම් අධ්‍යනය කර මෙම වැටුප් පරිවර්ථනය සිදු කළ යුතුය.

05. විශ්‍රාම වැටුප් සකස් කිරීමේ දී මෙම චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදයේ 7:1, 7:2, 7:3, 7:4 වගන්තිය කෙරෙහි අවධානය යොමු කර එම කටයුතු සිදු කරන ලෙසටත්, අතිකාල හා දිනවැටුප් හා අනෙකුත් දීමනා ලබාදීමේ දී චක්‍රලේඛයේ ලබා දී ඇති උපදෙස් අනුකූලවම කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

06. තවද සේවක අර්ථසාධක අරමුදල යටතේ සේවය කරන නිලධාරින්ගෙන් වැටුප් පරිවර්ථනය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව එම නිලධාරින්ගේ වැටුප් පරිවර්ථනය සිදු කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ (පාලන) - දැ.ගැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |